# බස්නාහිර පළාතේ,
# පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය

## (මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන සහ වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය - බස්නාහිර පළාත)

# තනතුරු ඇබෑර්තු

මාර්ග සහ මාර්ග ආශ්‍රිත ඉදිකිරීම් වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම තුළින්, මහජනතාවගේ ප්‍රවාහන කාලය අවම කර, සුව පහසු සහ ආරක්ෂිත මාර්ග පද්ධතියක් උරුම කර දීම මගින්, ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කර, පළාත් අතර සම්පත් බෙදී යාමේ විෂමතාවය අවම කිරීමේ අරමුණ පෙරදැරිව මෙම අධිකාරිය පිහිටුවා ඇත. ඒ අනුව, මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමට අදාළ වන පහත තනතුරු ඇබෑර්තුව සඳහා, බස්නාහිර පළාත තුළ වර්ෂ 03 ක ස්ථිර පදිංචිය සහිත, ක්‍රියාශීලී සහ ස්වයං උද්‍යෝගී ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. ඉංජිනේරු ( ද්‍රව්‍ය)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් ( පහත සුදුසුකම් i හෝ ii හෝ iii හෝ iv )**

i. සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයේ ද්‍රව්‍ය / කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

ii ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදාළව ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයේ ද්‍රව්‍ය කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

iii තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය කුසලතා (NVQ ) හත්වැනි ( 07 ) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එකක (01 ) පළපුරුද්දක් ලබා තිබීම.

iv විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදාළව රජයේ කාර්මික නිලධාරි විභාගයේ ( GTO) III කොටස සමත්, බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරියෙකු වීම,

සමඟ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයේ ද්‍රව්‍ය / නිර්මාණ / ඉදිකිරීම් කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප** : කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව අනුමත වැටුප් ව්‍යුහය

MM 1-3 :- රු. 55,925 - 10 X 1,375 - 15X 1,910 - 98,325/-

**වයස** : අවු. 22ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 2. කාර්මික නිලධාරි

## 3. පර්යේෂණාගාර තාක්ෂණ ශිල්පී

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

i. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු ආයතනයේ වසර 04 ක පූර්ණ කාලීන (සිවිල් ඉංජිනේරු) පාඨමාලාව ( NDES )

ii ජාතික තාක්ෂණික සහතික පත්‍ර විභාගය ( NCT ) - සිවිල් ඉංජිනේරු විභාගය සමත්වීම සමඟ වසර 05ක ක්ෂේත්‍ර පළපුරුද්ද

iii උසස් ජාතික තාක්ෂණික ( සිවිල්) ඩිප්ලෝමාව (HNDT)

iv ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය

v රජයේ කාර්මික නිලධාරි විභාගයේ ( GTO) I කොටස II කොටස සමත් වීම.

vi සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ ) පහ ( 05 ) වැනි මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වැටුප** : කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව අනුමත වැටුප් ව්‍යුහය

MA 2-2 - 2016 : රු. 30,310 - 10 X300 - 7X350-4X600-20X710 - 52,360/-

**වයස** : අවු. 18ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**අමතර ප්‍රතිලාභ :**

- ❖ රජයේ අනුමත අනෙකුත් දීමනා
- ❖ රජයේ අනුමත ජීවන වියදම් දීමනාව
- ❖ වාහන/ නිවාස/ආපදා ණය පහසුකම්
- ❖ වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

**පත්වීමේ ස්වභාවය :**

**ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සඳහා හිමිකම් සහිත යි.**

**අයදුම් කිරීම :**

1. ජීව දත්ත තොරතුරු සමග ඥාතීන් නොවන, තමන් පිළිබඳව නිර්දේශ කළ හැකි පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්, අධ්‍යාපනික/ වෘත්තීමය සුදුසුකම් සනාථ කිරීම සඳහා ඒ හා සම්බන්ධ සහතික පිටපත් සහිතව, අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේම දැනටමත් රජයේ/ සංස්ථාවන්හි/ ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි සේවයේ නියුතු අය, ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ තම ආයතන ප්‍රධානීන් මාර්ගයෙනි.
2. අයදුම්පත බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි, අදාළ තනතුරු නාමය සඳහන් කළ යුතුය.
3. සියලු අයදුම්පත් 2020.02.15 දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය

**සභාපති,**
**බස්නාහිර පළාතේ,**
**පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය,**
**අංක 59, ශාන්ත සෙබස්තියන් කන්ද, කොළඹ 12.**
**දුරකථනය : 0112-321990.**

Source: Diniamina (2020.02.01), Daily News (2020.02.03)